// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2123/18 - 2019 මැයි මස 13 වැනි සඳුදා - 2019.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: 4/2/1/90.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/2/2017/CEB/267.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 392/ඒ වෙරළුගම්පල ග්‍රාම නිලධාරී වසමේ වෙරළුගම්පල ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මූ.පි.ගම්. 4119 දරන පිඹුරුපතේ සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි 2.

මූ.පි.ගම් 4119 - කැබලි විස්තරය

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: පුංචි නැදුන්ගොල්ල; විස්තරය: වත්ත, අවුරුදු 25ක් පමණ වයසැති පොල් වගාවක්, අවුරුදු 2ක් පමණ වයසැති අන්නාසි වගාවක් සහ මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: පද්මිණී ලොකුබාලසූරිය, අංක 910/10/ජේ. අධිකාරම්වත්ත, ඇතුල්කෝට්ටේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1813.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: පුංචි නැදුන්ගොල්ල; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: අරුණ ආරියවංශ, අංක. 254/1, පැපිලියවල ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0031.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 ජූලි මස 24 වැනි දින පෙ.ව 10.00 ට දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2019 ජූලි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. ඩී. ජේ. ප්‍රසාද්,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ.

2019 මැයි මස 09 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-756

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 30059 - 37 (2019/05)

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 4/2/1/87.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/2/2016/CEB/20.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ අංක 2057/9 දරන හා 2018.02.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාගේ දැන්වීමෙහි මූ.පි.ගම් 4064 හි කැබලි අංක 1 පහත සඳහන් ලෙස කැබලි අංක 3, 4, 5 සහ 6 ලෙස ද කැබලි අංක 2හි ඉඩමේ නාමය රදාවාන එස්ටේට් ලෙසද සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*මූ.පි.ගම්. 4064*

**කැබලි අංකය 3**

ඉඩමේ නම: රදාවාන එස්ටේට්; විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ආර්. පුන්‍යසිරි රාමනායක, 66/1, රුවන, දෙමළගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0100.

**කැබලි අංකය 4**

ඉඩමේ නම: රදාවාන එස්ටේට්; විස්තරය: මාර්ග රක්ෂිතය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0025.

**කැබලි අංකය 5**

ඉඩමේ නම: රදාවාන එස්ටේට්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ආර්. පුන්‍යසිරි රාමනායක, 66/1, රුවන , දෙමළගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0036.

**කැබලි අංකය 6**

ඉඩමේ නම: රදාවාන එස්ටේට්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ආර්. පුන්‍යසිරි රාමනායක, 66/1, රුවන , දෙමළගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0162.

එම්. ඩී. ජේ. ප්‍රසාද්,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ.

2019 මැයි මස 10 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-757

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.